# ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු

1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade: 09 | විෂයය Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය Paper: I.II | කාලය Time: පැය 02 |

නම :- ........................................................................................ පංතිය :- ...........................

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- II කොටසේ පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

1) ත්‍රස්ත ප්‍රහාරයත් සමග ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ <u>බහින කලාව</u> ආරම්භ විය.
   I. කරදර පිට කරදර.
   II. ආදායම පහල වැටීම.
   III. අනවශ්‍ය විස්තර කිරීම.
   IV. ගෞරවය නැති වී යෑම.

2) ඔහුගේ මාගේ දියුණුවට <u>අකුල් හෙළනවා</u> සේ මට දැනේ.
   I. 1.අතු කඩා දමනවා.
   II. 2.බාධා කරනවා.
   III. 3.සහයෝගය දීම.
   IV. 4.සංවිධානය කිරීම

3) 'වැරදි තීරණයක් දීම හා අනුන් ලවා තමාගේ තීරණ ක්‍රියාත්මක කිරීම' යන අරුත් ඇති ප්‍රස්ථා පිරුළු වන්නේ,
   A. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ.
   B. බල්ලාගේ වැඩේ බූරුවා බාර ගත්තා වගේ.
   C. ගමරාළගේ වං ගෙඩිය වගේ.
   D. බළලුන් ලවා කොස් ඇට බැව්වා වගේ.

   I. A හා D    II.C හා B    III. A හා C    IV.B හා D

4) මුලින් දී ඇති පදයට සමානාර්ථ නොදෙන පද ඇතුළත් පිළිතුර තෝරන්න.
   I. සඳ - චන්ද්‍ර , තරුපති , තාරපති
   II. විශාල - විසල් , මහත් , තුමුල
   III. ජලය - පැන් , උදක , අඹ
   IV. ගස - තුර , රුක , සෙවණ

5) දී ඇති පද දෙකෙහි විරුද්ධාර්ථය දැක්වෙන පද දෙක සහිත වරණය තෝරන්න.

සෝෂ , ශබ්ද

I. නිසංසල , සෝෂ
II. නිශ්චල , කලහකාරි
III. අසෝෂ , නිශ්ශබ්ද
IV. නිසරු , නිදොස්

6) තාලුජ අක්ෂර පමණක් ඇති පිළිතුර තෝරන්න.
I. ච,ඡ,ජ,ඣ,ඤ
II. ක,ඛ,ග,ඝ,ඞ
III. ත,ථ,ද,ධ,න
IV. ප,ඵ,බ,භ,ම

7) අක්ෂර වින්‍යාසය නිවැරදි ලෙස යොදා ඇති පිළිතුර තෝරන්න.
I. ප්‍රාශ්වාස,දෘෂ්ටිය,සමස්ත
II. ප්‍රශ්වාස,දෘෂ්ටිය,සමස්ත
III. ප්‍රශ්වාශ,දෘශ්ටිය,සමස්ථ
IV. ප්‍රස්වස,දෘස්ටිය,සමශ්ථ

8) ක්‍රියා රූප දෙකක් එකතු කිරීමෙන් සැකසුණු යුගල පද වන්නේ,
I. නැටුම් - ගැයුම්
II. අඟර - දඟර
III. ලට්ට - ලොට්ට
IV. රොඩු - බොඩු

9) පහත සඳහන් ඉරි ඇඳි පද කුමන වර්ගයට අයත් දැයි තෝරන්න.

මා දුටු <u>**බියකරු**</u> සිහිනය මා කෙසේ නම් ප්‍රකාශ කරන්නද,

I. ක්‍රියා විශේෂණයකි.
II. නාම විශේෂණයකි.
III. නිපාත පදයකි.
IV. උපසර්ග පදයකි.

10) පොලිස් නිලධාරියාගේ <u>**කාරුණික**</u> හැසිරීම මා මවිතයට පත් කරයි.
I. නාම විශේෂණයකි.
II. ක්‍රියා විශේෂණයකි.
III. උපසර්ග පදයකි.
IV. අසම්භාව්‍ය ක්‍රියාවකි.

11) සතුරා විනාශ <u>**කරවි.**</u>
I. විධි ක්‍රියා II. මිශ්‍ර ක්‍රියා III. ප්‍රයෝජ්‍ය ක්‍රියා IV. අසම්භාව්‍ය ක්‍රියා

12) අම්මා උදෑසන <u>නැගිට</u> කිරිබත් පිසුවාය.

I. විධි ක්‍රියා
II. පූර්ව ක්‍රියා
III. ප්‍රයෝජ්‍ය ක්‍රියා
IV. අසම්භාව්‍ය ක්‍රියා

13) මල්ලී **<u>හඬමින්</u>** බත් කයි.

I. විධි ක්‍රියා.
II. මිශ්‍ර ක්‍රියා.
III. පූර්ව ක්‍රියා.
IV. අසම්භාව්‍ය ක්‍රියා.

•ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය යටින් ඉරක් අඳින්න.

14)

I. ඔවුහු ක්‍රීඩා කරයි.
II. සුළඟ හමයි.
III. බල්ලා බිරුහ.
IV. තුරු සුළඟට සෙලවෙති.

15)

I. මුහුදු රළ ගොඩබිමට ගලති.
II. කොඩි පෙළ සුළඟේ සසල වෙති.
III. ගිරා රැන හේනේ ලැගුම් ගත්හ.
IV. කුරුලු පෙළ අහසේ පියාඹති.

16)

I. විශාඛාවෝ ආරාමයක් පූජා කලහ.
II. සුජාතාවෝ කිරිපිඬු දන් පිරිනමයි.
III. තෙරහු පිඬුසිඟා වඩියි.
IV. වෘක්ෂයෝ සුළඟට සෙලවෙයි.

17)

1) නුඹලා සිහිනයක් දුටුවෙහු.
2) කිරිල්ලී කැදලි තනති.
3) නුඹලා පාඩම් කළෙහි.
4) නංගී මල් නෙලන්නීය.

• **පහත වාක්‍ය වල ඉරි ඇඳි කොටස් අයත් පද වර්ගය වන්නේ,**

18) හෙට <u>සිට</u> අලුත් ලෝකයක් දකිමු.

I. නාම පද II. ක්‍රියා පද III. නිපාත පද IV. උපසර්ග පද

19) ආහාර ලබා ගැනීම සඳහා **<u>අනුපිළිවෙලට</u>** පැමිණෙන්න.

I. නාම පද II. ක්‍රියා පද III. නිපාත පද IV. උපසර්ග පද

20) **<u>නිමල්</u>** මාගේ හොඳම මිතුරාය.

I. නාම පද II. ක්‍රියා පද III. නිපාත පද IV. උපසර්ග පද

**II කොටස**

- **•පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න..**

1) පන්ති කාමරයේදී ඔබ කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස නිම කළ පොත් පිංචක් සෑදීමේ ක්‍රියාකාරකම ඇසුරින් පිළිතුරු සපයන්න.

I. ඔබ සැකසූ පොත් පිංච කුමන මාතෘකාවක් යටතේ නිර්මාණය වූවක් ද?
(ලකුණු 01)

II. එම ක්‍රියාකාරකම කිරීමට පෙර ඔබට ගුරුතුමා දුන් උපදෙස් දෙකක් ලියන්න.
(ලකුණු 04)

III. එම පොත් පිංච සකස් කිරීමේදී ඔබට ඇති වූ ගැටලු දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 04)

IV. එම ගැටලු මගහරවා ගැනීමට ඔබ ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.
(ලකුණු 04)

V. එහි අඩංගු කරුණු 3ක් ලියන්න.
(ලකුණු 03)

**(මුළු ලකුණු 16)**

2) පහත සඳහන් **අ,ආ,ඇ,ඈ** කොටස් වලින් එකක් තෝරාගෙන වචන **200** කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.සුදුසු මාතෘකාවක් යොදන්න.

(අ). ලෝකයේ තාක්ෂණික දියුණුවත් සමග මිනිසා බොහෝ දේ සොයා ගත්තද ස්වභාවධර්මය සඳහා සුදුසු විකල්පයක් ඉදිරිපත් කිරීමට මිනිසා අපොහොසත් වී ඇත. එ නිසා ස්වභාවධර්මය රැක ගැනීම අප සතු යුතුකමකි.

(ආ). ගෙවතුවගාව කාර්මීකරණයත් සමග ක්‍රමයෙන් ගැමි ජීවිතයෙන් ඈත් වී ඇත.තම පවුලේ පරිබෝජනයට අවශ්‍ය එළවළු,පලතුරු,පලා වර්ග තම ගෙවත්තේ වගාකිරීම මුදල් ඉතිරි කිරීමක් මෙන්ම සතුට ඇති කරන්නක් ද වේ. එම නිසා ගෙවතුවගාව ප්‍රවර්ධනය කිරීමට රජයේ මැදිහත් වීම කාලීන අවශ්‍යතාවයකි.

(ඇ). කොරොනා වසංගතය ලෝක ප්‍රජාව බිලිගනිමින් පවතී. අද වනතුරු ඒ සඳහා නිශ්චිත ඖෂධයක් නිපදවීමට ලෝක බලවතුන් ද සමත් වී නැත.සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව මෙම වසංගතය මර්දනය කිරීම සඳහා ගත් පියවර ලෝක සෞඛ්‍ය සංවිධානයේද පැසසුමට ලක් වී ඇත.

(ඈ). දිනෙන් දින අසන්නට ලැබෙන අපරාධ පිලිබඳ තොරතුරු අපට කියාපාන්නේ සමාජයේ පවතින නොදියුණු බවයි. ආර්ථික ප්‍රශ්න මෙන්ම මිනිස් සම්බන්ධතා පිළිබඳ ගැටලු ද මෙයට ඉවහල් වි ඇත. අපරාධ මර්දනයට එකාමෙන් පෙළ ගැසීම කාලෝචිත වේ.

**(මුළු ලකුණු 14)**

3) පහත සදහන් කවි හා ගීත කොටස් සම්පූර්ණ කරන්න.

i. සිය පිරිවර රටතොට හැම වස්තුවක්ම නැති නි මිමා

..............................................................................

තුරු පිරිවර පුන් සඳ මෙන් වන මැද උන්නෙ මිමා

.................................................................................

උපුටාගත් ග්‍රන්ථය - .......................

II. මගේ රට මගේ දැය නිසා

.......................................

මදිවී ගියත් මට එපා

.......................................

රචකයාගේ නම - ......................

III. මල් මල් වාරම් හරි මැ උදාරම්

ගයවා ගයවා ගුවනේ

.............................................

.............................................

රචකයාගේ නම - ......................

IV. වටේ මහ මුහුදයි

සීතල සුළං විහිදයි

............................

.............................

රචකයාගේ නම - ......................

**(ලකුණු 2 1/2×4 = 10)**

4) පහත සදහන් උද්‍ධෘතයන් **කවුරුන් විසින් කාහට,කුමන අවස්ථාවේ** ප්‍රකාශ කරන ලද්දක් දැයි ලියන්න.

a. "මැණියනි, මම ඔබව ශ්‍රී පාදයට කැදවාගෙන යමි".

i. කවුරුන් විසින් - ..................................
ii. කා හට - ..................................
iii. කුමන අවස්ථාවේදී ද - .........................
iv. උපුටාගත් කෘතිය - .............................

1) "දරුවනි මම ලංකාවේ බොහෝ වෙහෙර විහාර වන්දනා කළෙමි".

i. කවුරුන් විසින් - ..................................
ii. කා හට - ..................................
iii. කුමන අවස්ථාවේදී ද - .........................

2) "අද අපිට විශේෂ දවසක් ඒ මේ කලායතනයේ දරුවන්ට සම්මාන ලැබීමක්"

i. කවුරුන් විසින් - ..................................
ii. කා හට - ..................................
iii. කුමන අවස්ථාවේදී ද - .........................

**(ලකුණු - 10)**

5) සුදුසු විරාම ලකුණු යොදන්න.

ඔබට නිරෝගී සුව අත්වේවා යනුවෙන් සදහන් වූ කාඩ් පත මා මවිතයට පත් කරවීය ඉකුත් මාසයේ සිට අධික රුධිර පීඩනය රුධිරයේ සීනි මට්ටම වැඩි වීම ආතරයිටිස් නැමත් සන්ධි රෝගයෙන් මම පෙළුනෙමි ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යන්හී පූර්ණ කාලීන මාධ්‍යවේදියෙකු වශයෙන් මෑතක් වෙන තුරුව කටයුතු කළෙමි මාගේ වැඩමුරය දිනපතා පෙව 6 30 ට ආරම්භ වේ

**(ලකුණු - 10)**

6) පුස්තකාල සාමාජිකත්වය ලබාගැනීම සඳහා ඔබගේ තොරතුරු ඇතුළත් කරමින් අකෘති පත්‍රයක් සකස් කරන්න. **සැ.යු** - නම, පංතිය, ඇතුලත්වීමේ අංකය, පංතිභාර ගුරුභවතාගේ නම ආදිය ඇතුළත් විය යුතුය.

**(ලකුණු -10)**